## ERRIN පිළිබඳව

**යුරෝපා ප්‍රත්‍යාගමන හා ප්‍රත්‍යානුකලන ජාලය (ERRIN)** හවුල්කාර රටවල් 15 ක බල මණ්ඩලයක් වන අතර ඉන් තවදුරටත් යුරෝපයේ සිටිය නොහැකි හෝ එසේ සිටීමට අකමැති සංක්‍රමණිකයන්ගේ ආපසු පැමිණීම හා නැවත ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සලසයි. මෙම ජාලය මගින් සිය මව්රට වෙත පෙරළා පැමිණෙන පුද්ගලයින් සඳහා උපදේශනය, අදාළ ස්ථාන වෙත යොමු කිරීම හා නැවත ඒකාබද්ධ කිරීමේ ආධාර ලබාදීමට කටයුතු සලස්වයි.

මෙම වැඩසටහන යටතේ. ස්වේච්ඡා මෙන්ම ස්වේච්ඡා නොවන ආපසු පැමිණෙන්නන් සඳහා ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ නැවත ඒකාබද්ධ කිරීමේ ප්‍රථම පියවර තැබීම සඳහා ආධාර කිරීමට ගිවිසුම් කළ සේවා සැපයුම්කරු වනුයේ IRARA වේ.

ERRIN සහභාගීත්වය දරන ජාතික නියෝජිත ආයතනවල මූල්‍ය ආධාර සමගින් යුරෝපා සංගමයේ රක්ෂස්ථාන, සංක්‍රමණ හා ඒකාබද්ධ කිරීමේ අරමුදල (AMIF) මගින් ආධාර සපයනු ලබයි.

වැඩි විස්තර සොයන්න: **www.returnnetwork.eu**

## ERRIN හවුල්කාර රටවල

| | යුරෝපීය හවුල්කාර |
|---|---|
| එක්සත් රාජධානිය | දේශීය කාර්යාලය |
| ඔස්ට්‍රියාව | දේශීය කටයුතු පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය |
| බෙල්ජියම | රක්ෂස්ථාන සොයනනන් සඳහා ෆෙඩරල් නියෝජිතායතනය/ෆෙඩරල් ආගමන කාර්යාලය |
| ග්‍රීසිය | දේශීය කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය |
| ජර්මනිය | දේශීය කටයුතු, ගොඩනැගිලි හා ප්‍රජා කටයුතු පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය – සංක්‍රමණ හා සරණාගතයන් සඳහා ෆෙඩරල් කාර්යාලය |
| ඩෙන්මාර්කය | ආගමන ඒකාබද්ධ කිරීමේ අමාත්‍යාංශය |
| නෙදර්ලන්තය | අධිකරණ හා ආරකෂක අමාත්‍යාංශය – මව්බිම වෙත පිටත්ව යාමේ සේවය |
| නෝර්වේ | ආගමන කටයුතු පිළිබඳ නෝර්වීජියානු මණ්ඩලය |
| පින්ලන්තය | ෆිනියානු ආගමන සේවාව |
| ප්‍රංශය | දේශීය කටයුතු අමාත්‍යාංශය – ආගමන හා ඒකාබද්ධ කිරීමේ කාර්යාලය |
| මෝල්ටා | ස්වදේශ කටයුතු හා ජාතික ආරකෂාව පිළිබඳ අමාත්‍යාංශය |
| ලක්සම්බර්ග් | විදේශ හා යුරෝපා කටයුතු අමාත්‍යාංශය |
| ස්පාඤ්ඤය | කම්කරු, සංක්‍රමණ හා සමාජ ආරකෂක අමාත්‍යාංශය – සංක්‍රමණ දෙපාර්තමේන්තුව |
| ස්විට්සර්ලන්තය | සංක්‍රමණිකයන්ගේ මහලේකම් කාර්යාලය |
| ස්වීඩනය | ස්වීඩන් සංක්‍රමණ නියෝජිතායතනය |

## අපව අමතන්න

ERRIN වැඩසටහන යටතේ මව්රට වෙත පෙරළා පැමිණෙන්නන් සඳහා IRARA කාර්යාල කොළඹ, මහනුවර, බදුල්ල හා කිලිනොච්චිය යන නගරවල පිහිටා තිබේ.

## IRARA

### අපි ඔබට උදව් කිරීමට සැදී පැහැදී සිටිමු

**පැමිණ හමුවිය හැකි ලිපිනය**
9" මන්ත්‍රී පාර, කොළඹ 05

**විවෘතව පවතින වේලාවන්**
සඳුදා – සිකුරාදා
පෙ.ව. 8.30 – ප.ව. 5.00

+94 (0)114 349 382

srilanka@irara.org

loc.srilanka@irara.org

www.irara.org/srilanka

IRARA

Chrysalis
Catalyzing change

ශ්‍රී ලංකා
සිංහල

# ආපසු පැමිණෙන සංක්‍රමණිකයින් සඳහා

# ERRIN ඒකාබද්ධතා වැඩසටහන

ERRIN
european return and reintegration network

Co-funded by the Asylum, Migration and Integration Fund of the European Union

Migration in Action
Migratie in Beweging

## ඔබ සහාය ලබාගැනීමට
## සුදුසුකම් ලබනවාද?

ඔබ ශ්‍රී ලාංකික ජාතිකයෙකු නම් හා ERRIN හවුල්කාර රටක් (ඉහළින් ලැයිස්තුගත කර ඇති), වෙතින් පෙරළා මව්රට වෙත යාමට ඔබට අවශ්‍ය නම් හෝ එසේ යාමට සිදුවී ඇති නම් ඔබ මෙම වැඩසටහනේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් සපුරාලීමට ඉඩ ඇත.

ආපසු පැමිණෙන්නන් සියලු වයස් හා ප්‍රභේදවලට අයත් ස්වේච්ඡා මෙන්ම ස්වේච්ඡා නොවන්නන්ද විය හැකි අතැ ර්ට පහත අය ඇතුළත් විය හැක:

- රක්ෂස්ථාන සොයන්නෝ
- ප්‍රතික්ෂේපිත රක්ෂස්ථාන සොයන්නෝ
- විධිමත් හා අවිධිමත් සංක්‍රමණිකයෝ
- භාරකරුවෙකු නොමැති බාලවයස්කාරයෝ
- වෙනත් අවදානමකට භාජනය විය හැකි පුද්ගලයෝ

යෝග්‍යතාව හවුල්කාර රටෙහි වගකිවයුතු බලධාරීන් විසින් තීරණය කරනු ලැබේ. නැවත ඒකාබද්ධ කිරීමේ ආධාර සපයනු ලබනුයේ එකී අධිකාරීන් මගින් සිදු කරනු ලබන සාධනීය තහවුරුකරණ පරීකෂාවකින් පසුව පමණි.

ඔබ හවුල්කාර රටකින් පෙරළා පැමිණ ඇති නම් හා ඔබ තවමත් ඒකාබද්ධවීමේ ආධාර සඳහා අයදුම්කර නැති වුවද තවදුරටත් ඔබ ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉඩ ඇත. කරුණාකර වැඩි විස්තර සඳහා IRARA කාර්යාල අමතන්න.

## ඔබට
## අයැදුම් කළ හැක්කේ
## කෙසේද?

ඔබට ERRIN හවුල්කාර රටවලින් එකක ඍසෘසෘෂභ සබඳතාව හරහා අයැදුම් කළ හැක. ඔබට ඔබේ සමාජ ක්‍රියාකරු හෝ උපදේශක වෙතින් වැඩි විස්තර දැනගත හැක.

ඔබේ ඒකාබද්ධ කිරීමේ සේවා ක්‍රියාත්මක කරනු ලබන්නේ ERRIN හවුල්කාර රටෙහි අනුමැතිය ලබාගැනීමෙන් පසු පමණි.

ඔබ දැනටමත් ශ්‍රී ලංකාව වෙත පෙරළා පැමිණ ඇත්නම්, මෙම පෝරමයේ පිටුපස ඇති ඇමතුම් විස්තර භාවිතයෙන් ඔබට IRARA හි දේශීය නියෝජිතයන් CHRYSALIS ඇමතීමෙන් අයැදුම් කළ හැක.

* ජාලයේ ඇති සෑම හවුල්කාර රටක්ම ERRIN ඔස්සේ ලබාදෙන නැවත ඒකාබද්ධ කිරීමේ ආධාර වර්තමානයේ ලබා නොදෙන බව කරුණාවෙන් සලකන්න. මෙය වෙනස් විය හැක. නවතම තොරතුරු සඳහා ඔබේ උපදේශක විමසන්න.

## ලබාදිය හැක්කේ
## කවර ආධාරද?

ERRIN වැඩසටහන යටතේ සියරට වෙත පෙරළා පැමිණෙන්නෙක් ලෙස ඔබේ මව්රටට පැමිණි විගස එහි ජීවිතය ඇරඹීම සඳහා උපකාර සැලසීමට IRARA ඔස්සේ සපයනු ලබන ආපසු පැමිණීමේ හා ඒකාබද්ධ කිරීමේ සේවා රැසකට සුදුසුකම් කීමට ඔබට හැකි වනු ඇත.

මෙම සේවා මූල්‍යමය නොවන ආධාර ලෙස (වෙනස් ආකාරයකින් ප්‍රකාශ කර නැතහොත්) ලබා දෙන අතර මෙම ආධාර ඔබ පැමිණෙන්නේ කොහි සිටද, ඔබේ හා ඔබට යම් විශේෂිත අවශ්‍යතා තිබේද යන්න මත පදනම්ව වෙනස් විය හැක.

## අනුගමනය කළ යුතු
## ක්‍රියාපිළිවෙත

### නික්ම යාමට පෙර

ඔබේ අයැදුම්පත ERRIN හවුල්කාර රටෙහි බලධාරීන් විසින් අනුමත කරනු ලැබ තිබේ නම් කටයුතු සූදානම් කිරීමට ආධාර වනු පිණිස ඔබට IRARA (www.irara.org) වතින් තොරතුරු ඉල්ලා සිටිය හැක.

### ඔබ පෙරළා පැමිණි විට

ශ්‍රී ලංකාව වෙත පැමිණි පසු IRARA මගින් මූලික ආධාර ලබාදිය හැක.

- ගුවන් තොටුපොළෙන් නංවා ගැනීම හෝ පැමිණෙන ස්ථානයේදී පිළිගැනීම
- රට තුළ අඛණ්ඩ ගමනාගමන ආධාර
- තාවකාලික නවාතැන්
- හදිසි වෛද්‍ය සත්කාර සඳහා යොමු කිරීම
- වෙනත් මූලික අවශ්‍යතා

## නැවත ඒකාබද්ධ කිරීමේ සේවා

ලද හැකි ප්‍රතිපාදන අගය ඇතුළත, ඔබේ තත්ත්වය හා අවශ්‍යතා සැළකිල්ලට ගන්නා ඔබට ගැලපෙන ලෙස සකසන ලද නැවත ඒකාබද්ධ කිරීමේ සැලසුමක් නිර්මාණය කිරීම සඳහා IRARA ඔබ සමග කටයුතු කරනු ඇත. සේවාවන්ට ඇතුළත් විය හැක්කේ :

- සමාජයීය, නෛතික හා වෛද්‍ය ආධාර
- වඩා දිගු කාලීන නිවාස ආධාර
- පාසැල්ගත කිරීම හා භාෂා පුහුණු
- රැකියා පුහුණුවීම් සඳහා වන ආධාර
- කාර්මික හා වෘත්තීය ආධාර
- ව්‍යාපාර ආරම්භ කිරීමේ ආධාර
- අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වෙන් වූ ආධාර පිළිබඳ

## පිළිබඳ

ERRIN වැඩසටහන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා IRARA Chrysalis සමග අත්වැල් බැඳ ගනී. Chrysalis (පෙර CARE International) යනු පුරවැසියන්ට සිය මව්රට තුළ නැවත පදිංචි වී ජීවිතය ගොඩනගා ගැනීමට උපකාර දීම අරමුණු කරගත් ශ්‍රී ලංකා සමාජීය ආයතනයකි.

IRARA හි සියලු වෘත්තිය උපදේශකයින් ශ්‍රී ලංකා ජාතිකයින් වන අතර පුද්ගලික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සාර්ථක නැවත ඒකාබද්ධනයක් සැපයීම සඳහා උපදෙස් හා සහාය ලබාදීමෙන් පුද්ගලයන් යළි පදිංචි කිරීමේ පු^ල් අත්දැකීමක් ඔවුන්ට ඇත.